# කිතුණු ඇදහිල්ලේ මූලධර්ම -4
# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේය

යේසුස්වහන්සේ මනුෂ්‍ය, නමක් සහ පවුලක් ඇතිව සිටි ගලීලයේ යුදෙව්වෙක්ය, වෙනත් ඕනෑම කෙනෙකු ආකාරයේ පුද්ගලයෙක්ය. නමුත් වෙනත් විධියකින් උන්වහන්සේ මෙතෙක් පොළොවේ සිටි ඕනෑම කෙනෙකුට වඩා වෙනස් කෙනෙක්ය. මෙම "වෙනත් ඕනෑම කෙනෙක් මෙන්ය, "යම් වෙනස් කෙනෙක්ය යන මත දෙක අතර සමබරතාවයක් සඳහා එකගතාවයකට පැමිණීම කිතුණු සභාවට ක්‍රියාකාරී සංවාදයක යෙදීමට ශත වර්ෂ පහක් ගතවිය. කිතුණු සභාව තුලද සාමාන්‍ය කිතුණු සංස්කෘතිය තුලද මෙම කාරණා මතු කිරීමේදී නොවැලක්විය හැකි ලෙස වෙනස් කෙනෙකු යන මතය දෙසට නැඹුරුවක් තිබුනේය. පැස්කල් කී පරිදි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මනුෂ්‍යයෙක් යයි එය ප්‍රතික්ෂේප කළ අයට පෙන්වාදීම උන්වහන්සේ දෙවියන්වහන්සේ යයි පෙන්වාදීම සභාවට වඩා අමාර දෙයක් වුයේය.- පිලිප් යැන්සෙ

යේසුස්වහන්සේ යනු කවුද? උන්වහනසේ දිව්‍ය මනුෂ්‍යයා නිසා උන්වහන්සේ අද්විතීයය.

නමුත් එය සරලව ප්‍රශ්නයකින් තොරව පිළිගැනීම ඇති අප මත පැටවූ ලබ්ධියක් නොවේ. එය බයිබලයේ සාක්ෂි වලට පිටතින් වර්ධනය වන නිගමනයකි. බොහෝ කරුණු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේය යන නිගමනය පෙන්වා දෙති. තවත් බොහෝ කරුණු උන්වහන්සේ සැබවින්ම මනුෂ්‍යයෙක් යන නිගමනයට මග පෙන්වයි. එතුමා තුල ඇත්තේ හීන නොවන දේවත්වයක් හා පූර්ණ මනුෂ්‍යත්වයේ ඒකත්වයකි - චාර්ල්ස් රයිරි

ඔබ කිසියම් කෙනෙකු සමග උන්වහන්සේ ගැන සාකච්ඡා කර ඇත්නම්, ශුද්ධ ලියවිලි මගින් ඔබගේ ඒත්තු ගැන්වීම් ඔප්පු කිරීමට හැකිවුනාද?

මුල් සභාව කාලයට යනවිට වෙනස් මත පවතිනවා. සමහර මිනිසුන් උන්වහන්සේගේ දේවත්වය ප්‍රතික්ෂේප කර තිබෙනවා. සමහර උන්වහන්සේගේ මනුෂ්‍යත්වයේ යථාර්ථය ප්‍රතික්ෂේප කර තිබෙනවා. සමහර දෙවි කෙනෙක් ලෙස උන්වහන්සේට පහත ස්ථානයක් දී තිබෙනවා, උදා: යෙහෝවාගේ සාක්ෂි කාරයෝ. සමහර උන්වහන් සේ නිකම්ම මිනිසෙක්, යහපත් මිනිසෙක් යයි කියනව . තම ඒත්තු ගැන්වීම් උදෙසා දිවි පිදු ශ්‍රේෂ්ඨ මිනිසෙක් යයිද එවැනි දේ අපට ආදර්ශයක් යයිද කියනව .(අද්වෛතවාදීන්)

## යේසුස්වහන්සේ සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේද?

ශුද්ධ ලියවිල්ල අපේ එකම තොරතුරු මූලාශ්‍රයයි. දෙවියන්වහන්සේගේ හුස්ම හෙළා ඇති නිසා එහි මුල් අත්පිටපත් වල වැරදී නොමැති බව අප ඉගෙනගෙන තිබෙනවා. එබැවින් යේසුස්වහන්සේ ගැන බයිබලය කියන දේ සත්‍යය වන අතර එය අපට විශේෂිතවූ මත වලට ගැළපෙන පරිදි සංස්කරණය කිරීමට නුපුළුවන .

**නිශ්චය කළ හැකිවන යම් ප්‍රශ්න බයිබලයෙන් අසමු.**

## ක්‍රිස්තුස් වහන්සේ බෙත්ලෙහෙමෙහි ඉපදීමට පෙර පැවතුනාද?

**කියවන් :** මීකා 5:2 සහ කොලොස්සි 1:16-17

යොහාන් 8:58: "අබ්‍රහම්ට පළමුවෙන් මම සිටියෙමි"

පරණ ගිවිසුම හා අළුත් ගිවිසුම යන දෙකෙහිම දෙවියන්වහන්සේගේ පුත්‍රයා උන්වහන්සේ පොළොවට පැමිණ අපේ මිනිසුන් බෙදාගැනීමට පෙර සිටිය බව පැහැදිලිව සඳහන් වෙනවා. උන්වහන්සේ සියලු දේවල මැවුම්කරු හා පෝෂකයාණන්ය.

## යේසුස්වහන්සේ කිසිවිටෙක තමා දෙවියන්වහන්සේ වීමට ඉල්ලා සිටියාද?

යේසුස්වහන්සේ කිසිවිටෙක දෙවියන්වහන්සේ වීමට ඉල්ල නොසිටිය නමුත් උන්වහන්සේගේ ගෝලයින් උන්වහන්සේගේ මරණයෙන පසු මිත්‍යා ප්‍රබන්ධ කළ බව ඇ යන සමහර සිටිනවා. නමුත් එම ප්‍රකාශනය ශුද්ධ ලියවිලි වල සාක්ෂි වලට එහෙම පිටින්ම පටහැනි වේ.

එතුමාගේ කාලයෙ යුදෙව්වරු උන්වහන්සේ කීදේ සම්පූර්ණයෙන් තේරුම්ගෙන තිබුනා.

**කියවන්න** යොහාන් 5:18

ඔවුන් කුපිත කරවීමට තරම් උන්වහන්සේ ඇ වේ කුමක්?

"මමද පියාණන්වහන්සේද එක්කෙනෙක්ය. " (යොහාන්10:30)

" නුඹලා මා හඳුනනවා නම් නුඹලා මාගේ පියාණන්වහන්සේද මා හඳුනනවා ඇත." (යොහාන්8:19)

" මනුෂ්‍යයෙක් මා දෙස බලන විට, ඔහු මා එවූ තැනන්වහන්සේද දකින්නේ ." (යොහාන්12:45)

" යම් කෙනෙක් මා දැක තිබෙනවාද, ඔහු පියාණන්වහන්සේද දැක ඇත. "(යොහාන්14:9)

"මට වෛර කරන තැනැත්තා මගේ පියාණන්වහන්සේටද වෛර කරයි. "(යොහාන් 15:23)

"පුත්‍රයාණන්ට ගෞරව කරන සියල්ලන් පියාණන්වහන්සේට ගෞරව කරති, පුත්‍රයාට ගෞරව නොකරන තැනැත්තේ උන්වහන්සේ එවූ පියාණන්වහන්සේටද ගෞරව නොකරයි " (යොහාන්5:23)

නොවරදින බසකින් යේසුස්වහන්සේ පියාණන්වහන්සේ සමග සමානත්වය කිය සිටියි. උන්වහන්සේගේ ජීවිතය සඳහා පරීක්ෂා කරනු ලබන විටදී හා දිවුරවන ප්‍රශ්න කරන විටදී පවා උන්වහන්සේ දහම අත්හැරියේවත් උන්වහන්සේගේ අනන්‍යතාවය හීන වීමට ඉඩ හැරියේවත් නැත.

**කියවන්න** මතෙව්26:63-65

## උන්වහන්සේගේ ගෝලයින් උන්වහන්සේ දෙවියන්වහන්සේ බව විශ්වාස කළාද?

පේත්‍රුස්ගේ පාපොච්චාරණය: " ඔබ වහන්සේ ජීවමාන දෙවියන්වහන්ගේ පුත්‍ර ක්‍රිස්තුස්වහන්සේය.( මතෙව් 16:16)

උන්වහන්සේ නැවත නැගිටීමෙන පසු උන්වහන්සේම තෝමස්ට එළිදරව් වන විට තෝමස් කථා කළේ " මාගේ ස්වාමීනි, මාගේ දෙවියන්වහන්ස" කියා .

උන්වහන්සේ ගේ නැවත නැගිටීමට පෙර උන්වහන්සේ විශ්වාස නොකළ, උන්වහන්සේගේ අර්ධ සොහොයුරු යුදස් උන්වහන්සේට කථා කළේ " යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපේ එකම මහෝත්තමයාණ හා ස්වාමීන්වහන්සේ " කියා .

## උන්වහන්සේ දෙවියන්වහන්සේගේ අද්විතීය ගති ලක්ෂණ විදහා පෑවාද?

මාර්ක්2:12හි, උන්වහන්සේ උන්වහන්සේගේ සර්වඥතාවය සහ පාප කමා කිරීමේ බලය විදහා දක්ව ඇත.

යොහාන්5:25හි උන්වහන්සේ මරණින් නැගිටීමේ පොරොන්දුව දී , තමා පියාණන් වහන්සේ මෙන් ජීවන උල්පත බවත ලෝකය විනිෂ්චය කිරීමේ බලය ඇති බවත විදහා පා ඇත.

යොහාන්15:26හි උන්වහන්සේ ස්වර්ගයට නැගුන පසු අදහන්නා සමග සිටීමට ශුද්ධාත්මයාණන්වහන්සේ එවන බවට පොරොන්දු ඇත.

මතෙව්28:20හි අප සමග සදාකාලිකව වැඩ සිටින බවට පොරොන්දු ඇත.

ශුභාරං තුලින් උන්වහන් සිදු කළ හාස් කම් මගින් උන්වහන්සේ සර්ව බලධාරිත්ව විදහා පා ඇත. උන්වහන් සෑම ආකාරයකම රෝග සහ ආබාධ සුවපත් කළේය. උන්වහන් කැලඹුන මුහුදට අණ කළේය. උන්වහන්සේ රොටී සහ මාළු වැඩි කළේය. උන්වහන් මළවුන් නැගිටෙව්වේය. උන්වහන් දෙවියන්වහන්සේට පමණක් කළ හැකි වැඩ සිදු කළේය.

## උන්වහන්සේ දේවත්වය කිය සිටින ප්‍රකාශ අප අය සනාථ කරනවාද?

**කියවන්: මතෙව්14:33.** දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙස උන්වහන් නමස්කාර කරනු ලැබ තිබෙනවා. යුදෙව් භාවිතය තුල මෙය මනු කළේ

පහත කිරීමකට වඩා සමකිරීමට හා ස්වභාවයෙ අනන්‍යතාවයක ලෙසය.

**කියවන්: කොලොස්සි2:9.** උන්වහන් තුල දේවත්වය සම්පූර්ණයෙ ශරීරාකාරයෙන වාසය කරන්නෙ .

යේසුස් ක්‍රිස්තුස්වහන් නම් සම්පූර්ණ ලෙසම දෙවියන්ගෙ බව වක්‍රෝක්තියෙන්තොරව සඳහන කර ඇති තැන කීපයක් මෙසේය.

**කියවන්: හෙබ්‍රෙව්1:23.** උන්වහන් දේවත්වයෙ නියම ස්වරූපය වූ සේක.

**කියවන්: එළිදරව් 19:16.** **"රජුන්ගේ රජ හා ස්වාමීන් ස්වාමීය "**

උන්වහන්ගෙ සත්‍යය, උන්වහන්සේ දෙවියන්වහන්සේ වෙතට මාර්ගය, සහ උන්වහන්සේ සදාකාලික ජීවිතයේ උල්පත නිසා පොළොව මත අපේ ජීවිතය හා උන්වහන්සේගේ අතෙහිවූ සදාතනික අනාගතය ගැන අපට විශ්වාසය තැබීමට පුළුවන. උන්වහන්සේ දෙවියන්වහන්සේ නොවේ නම් අපේ ඇදහිල්ල ගොඩනගා ඇත්තේ වැලි අත්තිවාරමක මතය. අපට බලාපොරොත්තුව නැත, අපේ පාප තුල අප මැරෙනවා ඇත, අප සියලු මිනිස්සුන ගෙන් වඩාත කාලකණ්ණි අයයි.

අප පිළිතුරු දිය යුතු අනෙක් ප්‍රශ්නය නම්:

## යේසුස්වහන්සේ සම්පූර්ණ ලෙස මනු ෂ්‍යයක්ද?

යේසුස්වහන්සේ සම්පූර්ණවශයෙන මනු ෂ්‍යයක බවට බයිබලය බහුලව සාක්ෂි දෙයි.

උන්වහන්සේගේ උපත අද්විතීයයි .

ශරීරයකින ලොව පහළවීම් යනු මාංශය තුලය . දෙවියන්වහන්සේ මනුෂ්‍යවර්ගයා ආක්‍රමණය කරන විට, එතුමාගේ පිළිසිඳ ගැනීම සහ ළදරුවෙ ලෙස උපත ලැබීම් අද්විතීය විය.

දේව දූතයෙක් මරියා නම් තරුණ කාන්තාවකට ශුද්ධාත්මයාණෝ ඇය කෙරෙහි පැමිණ, ඇය ගැබ්ගෙන පුත්‍රයෙකු බිහි කරන බවද උන්වහන්සේ ශුද්ධ බවද මහෝත්තමයාණන්ගේ පුත්‍රයා වන බවද කීවේය. දේවදූතයන් උන්වහන්සේගේ උපත ලොවට දැන්වූයේය.

**උන්වහන්සේගේ ස්වභාවය අද්විතීයයි**

යේසුස්වහන්සේට මනුෂ්‍ය ස්වභාවයක් තිබුනේය, නමුත් උන්වහන්සේට පාපී ස්වභාවයක් තිබුණේ නැත. උන්වහන්සේ පාපයෙන් තොරවූ අතර එසේ කිය සිටීමට හැකි වෙනත් කිසි මිනිසෙක් ඇත්තේ නැත.

**කියවන්න:** හෙබ්‍රෙව්4:15 සහ 2 කොරින්ති5:21

මෙය එතරම් වැදගත් වන්නේ ඇයි? උන්වහන්සේ අප වාගේ තවත් පව්කාරයෙක් වූවා නම් උන්වහන්සේසේට අපගේ ආදේශකයෙක් ලෙස මැරෙන්ට නොහැකි නිසාය . උන්වහන්සේට පුළුවන් වන්නේ උන්වහන්සේගේම පව් උදෙසා මැරීමට පමණය. අපට අවශ්‍ය වූයේ පාපය නැති ගැළවුම්කාරයෙක් , එම සුදුසුකමට ඉදිරිපත් විය හැක්කේ දෙවියන්වහන්සේට පමණය.
උන්වහන්සේගේ පැමිණීම හේතු වූයේ කුමක්ද?

උන්වහන්සේගේ මනුෂ්‍යයත්වයේ ඔප්පු කිරීම්

උන්වහන්සේ අනිත් සෑම මනුෂ්‍යයෙක් වාගේම පරිනත වූයේය.( ලූක 2:40,52)

උන්වහන්සේට මනුෂ්‍ය ශරීරයක් තිබුනේය: දැකීම , ඇසීම හා ස්පර්ශය (1යොහාන් 1:1)

උන්වහන්සේට මනුෂ්‍ය ප්‍රානයක් හා ආත්මයක් තිබුනේය. (මතෙව්26:38, ලූක 23:46)

උන්වහන්සේ මනුෂ්‍ය නාම ඇතිව සිටියේය, මනුෂ්‍ය පුත්‍රයා, දාවිත්ගේ පුත්‍රයා, යේසුස්.

උන්වහන්සේට බඩගිනි විය. (මතෙව්4:2).

උන්වහන්සේට පිපාස විය.( යොහාන්19:28).

උන්වහන්සේට මහන්සි විය.(යොහාන්4:6)

උන්වහන්සේ ඇඬුවේය(යොහාන්11:35).

උන්වහන්සේ හැඟීම් පෙන්වීය. (මාර්ක් 6:34,ලූක 7:13, කරුණාව ;10:14, කෝපය; මාර්ක්14:34, ශෝකය: යොහාන්11:5 ආදරය).

උන්වහන්සේ පරීක්ෂා කරනු ලැබීය(හෙබ්‍රෙව්4:15).

උන්වහන්සේ යාඥා කළේය.(ලූක 5:16).

උන්වහන්සේ මැරුනේය (යොහාන්19:30,33).

උන්වහන්සේ මනුෂ්‍යයකු ලෙස පැමිණීමේ අරමුණු

මිනිසුන්ට දෙවියන්වහන්සේ එළිදරව් කිරීමට (යොහාන්1:18)

ජීවත්වීම සඳහා ආදර්ශයක් දීමට(1පේත්‍රුස්2:21).

මනුෂ්‍යාත්වයේ පාප සඳහා පූජාවක් ලෙස මිය යාමට (හෙබ්‍රෙව්10:1-10)

උන්වහන්සේට කරුණාවන්ත උත්තම පූජකයා වීමට හැකිවන පිණිස(හෙබ්‍රෙව්4:15-16).

යක්ෂයාගේ ක්‍රියා විනාශ කිරීමට ( 1යොහාන්3:8).

මරණයේ බිය බැම්මෙන් අප මුදවා ගැනීමට ( හෙබ්‍රෙව්2:14-15)

ලෝකයේ ගැළවුම්කරු වීමට (1යොහාන්4:14).

මෙය විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කර ගැනීමට උපකාර වන අප බැලිය යුතු තව එක ජේදයක් තිබෙනවා.

**කියවන්න** පිලිප්පි2:5-11)

උන්වහන සේ තමන විසින්ම කිසිවෑ සෑදුවේ වත තමන විසි කිර්තියෑ ගොඩනගාගත්තේව නැත. ඇමෙෆයිඩ් බයිබල් අනුවාදයෞ "උන්වහන්සෙ උන්වහන්සෙ විසින්ම හිස" වූ බව කියයි.

ක්‍රිස්තුස්වහන්සේ පොළොවට එනවිට උන්වහන්සෙ දේවත්වයේ සමහර අංග හෝ අංග සියල්ල හෝ හිස කළාද?

හිස්කිරීම යනු ක්‍රිස්තුස්වහන්සෙ උන්වහන්සේගේ දිව්‍යමය ගති ලක්ෂණ සමහරක උන්වහන්සේගෙ පොළොවේ ජීවිත කාලය තුලදී අත්හැර දැමුවාද නැතහොත් නැති වුනාද, අප දැනටමත බලා ඇති වෙනත් ශුද්ධ ලියවිලි එම මතයට පටහැනි වෙති. මෙම ජේදය කියන්නෙ මනු ෂ්‍ය ශරීරය හා ස්වභාවය ගැනීමෙන් සහ අපරාධ දඬුවමක් හැටියට කුරුසිය මත මරණයට පත්වීමෙන් උන්වහන්සේම යටහත වු බවයි. මෙයින් කියන්නෙ උන්වහන්සේගෙ දේවත්වයෙහි අඩුවක් වී නැති බවයි. නමුත් මනු ෂ්‍යත්වය එහි ඵල විපාක වල සීමාවන් සමග එක කරගෙන ඇති බවයි.

> **ක්‍රිස්තු ස්වහන්සේගේ මූර්තිමත්වීමේ මහිමය වැසී තිබීමේ සංකල්පය**
> (යොහාන්17:5), පාපී මාංශයෙ ආකාරය වන අවමානයට පත්වීම උන්වහන්සේම ගැනීම ,(රෝම8:3) උන්වහන්සේගේ පොළොවේ ජීවිත කාලය තුලදී උන්වහන්සේගේ සමහර දේවත්ව ලක්ෂණ ස්වේච්ඡාවෙන්ම පාවිච්චි නොකර සිටීම ආදිය සමග සම්බන්ධිත (මතෙව්24:36). උන්වහන්සේගෙ මනු ෂ්‍යත්වය මහිමයට පත මනුෂ්‍ය ත්වය නොව, පරීක්ෂාව , දූර්වලකම, වේදනාව හා ශෝකයට ලක මනුෂ්‍යත්වයකි. උන්වහන්සේගේ දේවත්වයේ ගති ලක්ෂණ පාවිච්චි නොකිරීමට තෝරාගැනීම ඒවා අතහැර දැමුවා යයි කියනවාට වඩා ඉතා වෙනස්ය. පාවිච්චි නොකිරීම යනු අඩුකරදැමීමක නොවේ- රයිරි පිටු අංක 58,59.

යේසුස්වහන්සේ යනු සැබවින් දෙවියන්වහන්සේව හා සැබවින් මනු ෂ්‍යයෙකුව සිටිය සහ සිටි , හීන නොවන දේවත්වය සහ පරිපූර්ණ මනුෂ්‍යත්වය සදාකාලිකව එක පුද්ගලයෙ තුල තිබීමයි.

සී.එස්. ලෙවිස් එය හොඳින් සටහන තබයි.

> මිනිසුන් බොහෝවිට උන්වහන් ගැන කියන ඇත්ත වශයෙන්ම මේ මෝඩදේ කිසිවෙක් කීමෙන් වැලැක්වීමට මම මෙහි උත්සහය ගන්නව . එනම්: මම යේසුස්වහන්සේ ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකු යයි පිළිගැනීමට සූදානම්, නමුත "උන්වහන් දෙවියන්වහන්සේ යයි කීම මා පිළිගන්නෙ නැහැ. එය කීම නොකිව යුතු එක දෙයක්ය. නිකම්ම මිනිසෙක්ව සිටි යේසුස්වහන්සේ කියූ ආකාරයෙ දේවල් කීම, ශ්‍රේෂ්ඨ සදාචාර ගුරුවරයෙ නොවනවා ඇත. උන්වහන්සේ මඳ ගින්න තම්බාගත් බිත්තරය යයි කියන කෙනකු හෝ උන්වහන්සෙ අපායේ යක්ෂය වෙන්නට ඇතැයි කියන කෙනෙකුගේ මට්ටමෙ උන්වහන් උන්මත්තකයෙ හෝ පිස්සෙක වුවා විය හැක. ඔබ ඔබේ තෝරාගැනීම කළ යුතුයි. එනම් මේ මිනිසා දෙවියන්වහන්සේගේ පු යා වුවා හෝ වනවා නැත්නම් පිස්සු මිනිහෙ හෝ වඩා නරක යම් දෙයක. ඔබට ඔහු මෝඩයෙකු ලෙස ගණන් නොගෙන සිටීමට පුළුවන් උන්වහන්සේට කෙල ගසන්න පුළුවන් යකෙකු සේ මරන්න පුළුවන් නැතහොත් ඔබට උන්වහන්සේගේ පාද පාමුල වැටී ස්වාමීන්වහන්සේ හා දෙවියන්වහන්සේ යයි කියන්නට පුළුවන නමුත් උන්වහන්සෙ ශ්‍රේෂ්ඨ ගුරුවරයෙක් හැටියට සිටියා යයි වැනි නිරර්ථක

වර්ණනා කිරීම් නොකර සිටිමු. උන්වහන්ෙ එය අපට විවෘත කර අප හැරදා ගොස් නැත. උන්වහන්සේ එසේ අරමුණු කළේද නැත.

අපේ ස්වාමීි යේසුස් ක්‍රිස්තුස්වහන්ෙ ගැන ශුද්ධ ලියවිල කුම් කියන්ෙ දැයි වටහාගැනීම් එතරම් වැදගත් වන්නෙ ඇයි? උන්වහන්සෙ කවුද කියාත් උන්වහන් කළ දේවල් තහවුරු කරන නිසාත් . උන්වහන් අද්විතීය දිව්‍ය- මනුෂ්‍යයා නොවුවා නම් අසාධාරණ ලෙස වද හිංසා වලට ලක්ෙ දිවි පිදූ තවත් එක්කෙනෙ පමණය. එය කළ වෙනත් බොහෝ දෙනා සිටිනවා, උන්වහන් දිව්‍ය- මනුෂ්‍යයාය, උන්වහන් දුක , අපගේ පාප උදෙසා අප වෙනුවට මැරී, අපගෙ සුභසෙත පිණිස ජයග්‍රාහී ලෙස මරණින නැගිටුන සේක. ඉන්පසු උන්වහන්ෙ ආපසු ස්වර්ගයට නැගුනු සේක. සැකයේ හෙවනැල්ලක්වත් නැතිව අපට උන්වහන්ෙ විශ්වාස කිරීමට පුළුවන. උන්වහන්සේගේ සියලු පොරොන විශ්වාස කිරීමට පුළුවන. වැටුප ලෝකයක ජීවිතය දෙස සදාතනික දැක්මකින් බලන්න අපට හැකිය . අපට බලාපොරොත්තු ,ධෛර්ය, විපත්තියේදී උද්‍යෝගය, ශෝකය මැද ප්‍රීතිය, අරගල මැද සමාදානය, අපේ ජීවිත සඳහාවූ දෙවියන්වහන්සේගේ සැලසුම් තුල ඇදහිල්ල, අප අය කෙරෙහි ප්‍රේමය, සමාව දීමට පුළුවන්ක , සහ අප කෙරෙහි වූ මරණය: අපේ උතුම් දෙවියන්වහන්ෙ සහ ගැළවුම්ක , ස්වාමීි යේසුස් ක්‍රිස්තුස්වහන්ෙ ගේ වැඩසිටීම තුලවූ සදාතනික මහිමයට දොරටු ඇරීමක් පමණය යන්න ගැන ඒකාන්ත නිසැකකම් අපට දෙන්නෙ එයයි.

## අධ්‍යයන ප්‍රශ්න

**කියවන්** යෙසායා9:6; මීකා5:2; යොහාන්8:58; කොලොස්සි1:16

1. දෙවියන්වහන්සේගේ පුත්‍රයා ගැන මෙම බයිබල් කියන්ෙ මොනවාද? උන්වහන්සේ කැඳවීම කුමක්ද? උන්වහන් කර ඇත්තේ කුමක්ද? උන්වහන්සේෙ ජීවිතය පටන්ගත් කවදාද?

**කියවන්** යොහාන්1:18

2. වාක්‍යාණෝ (පද1,14)කවුද? ප්‍රකාශ කරනු ලැබුවේ කවුද? උන්වහන්ෙ කුමක උල්පතද? මෙම ජේදයෙන් ඔබ උන්වහන්ෙ කෙසේ විස්තර කරනවාද?

**කියවන්** යොහාන්5:18; 8:19;10:30;14:7,9;12:44; මතෙව්26:63-65

3. යේසුස්වහන්සේ කීවේ තමා කවුරුද කියා? උන්වහන් පියාණන දෙවියන්වහන්සේ සමග වූ සම්බන්ධතාවය ගැන කීවේ කුමක්ද?

**කියවන්** මාර්ක්2:1-12; යොහාන්5:27; යොහාන්15:26; යොහාන්5:25; මතෙව්28:18;28:20;

4. දෙවියන්වහන්සේෙ කුමන චරිත ලක්ෂණ හා පරමාධිකාරය යේසුස්වහන්සේ තමා විසින්ම කිය සිටියා? උන්වහන් කිය දේවල් සත්‍යය නොවුයේ නම් එය අපේ ඇදහිල් මත කෙසේ බලපාන්නට තිබුනා ?, අපේ ගැළවීම මත කෙසේ බලපාන්නට තිබුනා ?

**කියවන්** යොහාන්1:18; 1පේත්‍රුස්2:21;හෙබ්‍රෙව්2:14-15;5:1-2; 10:1-10; 1යොහාන්3:8

5. දෙවියන්වහන්සේගේ පුත්‍රයා මනුෂෙ යෙකු බවට පත්වීමේ යම් අරමුණු ලැයිස්තුවක ලියන්න.

**කියවන් මතෙව්4**:2; ලූක 2:40,52; යොහාන්4:6; 11:35;19:28,30,33

6. යේසුස්වහන්සේගේ මනුෂ්‍යත්වය ගැන මෙම බයිබල් පද දෙන සාක්ෂි මොනවාද? යේසුස්වහන්සේගේ සම්පූර්ණ දේවත්වය හා මනුෂ්‍යත්වය තුල අදහාගැනීම අවශ්‍ය වන්නෙ ඇයි?

**කියවන්** යොහාන්8:46;2කොරින්ති5:21; 1පේත්‍රුස් 2:22; හෙබ්‍රෙව්4:15;1යොහාන්3:5

7. ඉපදුන අනෙක් සෑම පුද්ගලයෙකුටම වඩා ක්‍රිස්තුස්වහන්සේ වෙනස් වන්නේ කොහොමද? මෙය අවශ්‍ය වුයේ ඇයි?

**කියවන්** පිලිප්පි 2:6-11

8. මනු ෂ්‍යයින් ගැළවීමට පුළුවන්වන පරිදි යේසුස්වහන්සේ ඕනෑකම් කළේ කුමක්ද? උන්වහන්සේගේ දැන් තත්වය කුමක්ද? සියලු මිනිසුන් අවසානයේදී කුමක් කරයිද? ඔබේ ජීවිතයේ සෑම කාරණයකම ස්වාමීන්වහන්සේ ලෙස ඔබ යටත් කර තිබෙනවාද?